# බෝගොල්ලාගම සිතා ඉන්නේ ලංකා ක්‍රිකට් කණ්ඩායම සෙල්ලම් බඩු ලෙසයි -ශිරාල්



(ලංකා ඊ නිව්ස් 2009 මාර්තු 06 ප.ව.5.50)

නැවත වතාවක් පාකිස්ථානු රජය ඉල්ලීමක් කළොත් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පිටත් කර යැවීමට කටයුතු සූදානම් කරන බවට විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම මහතා කළ ප්‍රකාශයක් පිළිබඳව අද (06) එක්තරා ඉංග්‍රීසි පුවත්පතක පළ වී ඇති බවත්, ඔහු සිතා සිටින්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සෙල්ලම් බඩු ලෙස බවත්, ලෝකයේ සෑම රටක්ම වෘත්තීය ක්‍රිකට් ක්‍රීඩකයන් ආරක්ෂාව පිළිබඳව දැඩි අවධානය යොමු කරද්දී මුත්‍රා අඩස්සියේ සිට මෙවැනි ප්‍රකාශ නොකරන්නැයි ඉල්ලීමක් කරන බවත්, වාත්තීය ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමයේ හිටපු සම ලේකම් ශිරාල් ලක්තිලක මහතා 'සංවර්ධන විමසුම' අද (06) කැඳවා තිබූ මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා රජය කරගෙන යනු ලබන යුද්ධයට පාකිස්ථානු රජය කොන්දේසි විරහිතව දක්වූ සහයෝගයට කෘත ගුණ සැලකීමක් ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පාකිස්ථානයට පිටත් කර යැවූ බව පසුගියා පැවැති මාධ්‍ය හමුවකදී අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා ප්‍රකාශ කර ඇති බවත්, යුද්ධය වැනි සාධකයකට දක්වූ සහයෝගය වෙනුවෙන් කෘත ගුණ සැලකීමට ක්‍රිකට් කණ්ඩායම භාවිතා කිරීම කෙතරම් උචිතදැයි මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයට පිළිතුරු දුන් ලක්තිලක මහතා ප්‍රකාශ කළේ ක්‍රිකට් කණ්ඩායම පාකිස්ථානයට යැවීමේදී තෘප්ත කළ යුතු ප්‍රමිතීන් කිහිපයක් තිබූ නමුත් ඒ කිසිවක් කෙරෙහි අවධානය යොමු නොකර පටු පරමාර්ථ මත ක්‍රිකට් කණ්ඩායම බිල්ලට දෙන ආකාරයේ තීන්දු ගත් ආණ්ඩුව ඒ අවලාද වලක්වා ගැනීමට මේ කාරණයේදීත් යුද්ධය ඉදිරියට දමන බවත්, බලධාරීන් කල්පනා කරන්නේ කණ්ඩායමේ ආරක්ෂාව ගැන නොව කණ්ඩායම උපයන මුදල් සොරකම් කරන ආකාරය පිළිබඳව බවත්ය.

අපේ රට යුධ ජයග්‍රහණ ලබමින් සිටින මොහොතක මුරලි, අජන්ත මෙන්ඩිස් වැනි ක්‍රීඩකයන්ගේ ආරක්ෂාව පිළබඳව මීට වඩා වැඩි උනන්දුවක් දැක්විය යුතු බවත්, පාකිස්ථාන සංචාරයට සහභාගි වූ ක්‍රිකට් ක්‍රීඩකයන්ට ප්‍රකාශ කරන ආකාරයට පාකිස්ථානයේදී කණ්ඩායමට අවශ්‍ය පහසුකම් සහ ආරක්ෂාව ලැබී

නැති බවත්, ලෝකයේ වෙනත් රටවල් තම ක්‍රිකට් කණ්ඩායමේ සංචාරයට පෙර ආරක්‍ෂක නිලධාරීන් පවා අදාල රටේ ආරක්‍ෂාක තත්ත්වය පිළිබඳව සොයා බලන බවත් 1996 දී පාකිස්ථාන හා ඉන්දීය ඒකාබද්ධ කණ්ඩායම ලංකාවට පැමිණීමට පෙර 'බ්ලැක් කැට්ස්' නම් කණ්ඩායමක් පැමිණ ආරක්‍ෂාව පිළිබඳ වාර්තාවක් ලබාගත් බවත්, ශ්‍රී ලංකා රජය මේ කිසිවක් අනුගමනය නොකර ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අනතුරේ හෙලූ බවත්, මාධ්‍ය හමුවට පැමිණි හිටපු ටෙස්ට් ක්‍රිකට් නායක හෂාන් තිලකරත්න මහතා ප්‍රකාශ කළේය.

'හෙල්පින් හම්බන්තොට' ගිණුම සම්බන්ධයෙන් මහින්ද රාජපක්‍ෂට හොරා යැයි කියූ ගාමිණී ලොකුගේ මහතා දැන් මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිවරයාගේ දෑත් ශක්තිමත් කරන්නට ගොස් එක්සත් ජාතික පක්‍ෂයට දොස් කියමින් සිටිනවා හැර ඔහු දන්නා ක්‍රිකට් ක්‍රීඩාවක් නැතැයි ද තිලකරත්න මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

සිසිර සී. විතානගේ